පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව - සති පාසල

අප්‍රේල් 4 වන සතිය

විෂය - විද්‍යාව

9 ශ්‍රේණිය

කාලය - පැය 2

සැකසුම - එස්.ඒ. අමාලි උදයංගනී
ර/නිවි/ නහල්වතුර විද්‍යාලය


Department of Education, Sabaragamuwa Province/ Weekly School

**<u>ඒකක අවසාන අභ්‍යාස.</u>**

* <u>නැවත 1,2,3,4 හා 5 පාඩම් කියවා පිළිතුරු සපයන්න.</u>

1. මැලේරියා රෝගය සඳහා ව්‍යාධිජනකයා වන්නෙ,
   a. දිලීර
   b. වෛරස
   c. බැක්ටීරියා
   d. ප්‍රොටොසෝවා
2. රනිල කුලයේ ශාකවල මූල ගැටිතිවලදී වායුගෝලීය නයිට්‍රජන් තිර කරනු ලබන්නේ,
   a. දිලීර
   b. බැක්ටීරියා
   c. ඇල්ගී
   d. වෛරස
3. ඇසට ඇතුලු වන ආලෝක ප්‍රමාණය පාලනය කරන්නේ,
   a. කණිනිකාව
   b. රුධිර ග්‍රාහිය
   c. තාරා මණ්ඩලය
   d. කාච රසය
4. ඇතුලු කනට අයිති කොටස් වන්නේ මේවා අතරින් මොනවාද ?
   a. යුස්ටේකීය නාලය, කර්ණ සංඛ්‍ය, ශ්‍රවණ ස්නායුව
   b. කර්ණ අස්ථිකා, කර්ණ සංඛ්‍ය, යුස්ටේකීය නාලය
   c. කර්ණ සංඛ්‍ය, ශ්‍රවණ ස්නායුව, අර්ධ චක්‍රාකාර නාල
   d. ශ්‍රවණ ස්නායුව, කර්ණ සංඛ්‍ය, කර්ණ අස්ථිකා
5. සම පරමාණුක අණුවක් වන්නෙ,
   a. $H_2O$
   b. $CO_2$
   c. $NH_3$
   d. $Cl_2$

6. පරමාණුක න්‍යෂ්ටියේ ඇති උප පරමාණුක අංශු වනුයේ,
    a. නියුට්‍රෝන
    b. ප්‍රෝටෝන හා ඉලෙක්ට්‍රෝන
    c. ප්‍රෝටෝන
    d. ප්‍රෝටෝන හා නියුට්‍රෝන
7. වස්තුවක් මත බලයක් යෙදී ඇති ආකාරය රූපිතව නිරූපණය කර ඇත. ඒ සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ,




    a. බලයේ විශාලත්වය 5N වේ.
    b. බලයේ උපයෝගී ලක්ෂ්‍ය x වේ.
    c. බලයේ දිශාව සරල රේඛාවේ දිගෙන් නිරූපණය වේ.
    d. බලයේ උපයෝගී ලක්ෂ්‍ය 5N මගින් නිරූපණය වේ.
8. ගලක් දුනු තරාදියක එල්ලූ විට දුනු තරාදි පාඨාංකයෙන්,
    a. ගලේ බර ලැබේ.
    b. ගලේ ස්කන්ධ ලැබේ.
    c. ගලේ ඝනත්වය ලැබේ.
    d. ගලේ පීඩනය ලැබේ.
9. පීඩනය සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ,
    a. පීඩනය = අභිලම්බ බලය /පෘෂ්ඨ වර්ගඵලය
    b. පීඩනය මනින ඒකක Pa වේ.
    c. පීඩනය වර්ගඵලය හා අභිලම්බ බලය මත රඳා පවතී.
    d. පීඩනය ඝනත්වය මත රඳා පවතී.
10. මේවා අතරින් සමජාතීය මිශ්‍රණයක් වන්නේ,
    a. ලුණු ද්‍රාවණය
    b. බොර ජලය
    c. බදාම මිශ්‍රණය
    d. පලතුරු සලාදය